## දේශීය ණය සහ සංවර්ධන අරමුදල-2010 .

### 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදල 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මුළු හිඟ ණය ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන ණයගැතියන් ලෙස හඳුනාගෙන තිබුණි. වර්ෂ එකක කාල පරිච්ඡේදයක් ඇතුළත නිරවුල් කළ යුතු ණය වාරික ශ්‍රී.ල.ගි.ප්‍ර. 3 ප්‍රකාරව ජංගම ණයගැතියන් ලෙස දක්වා නොතිබුණි.

#### 1.2.2 නොසැසඳූ වෙනස්කම්

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් සමඟ උපලේඛන සැසඳීමේදී පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයය | සටහන්වලට අනුව මුදල | උපලේඛනවලට අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ප්‍රාදේශීය සභා ණයගැති ශේෂය (සටහන් 2) | 402,878,727 | 403,021,352 | 142,625 |
| ලැබුණු පොලී (සටහන් 5) | 22,542,923 | 22,545,037 | 2,114 |

(ආ) 2010 ආරම්භක ශේෂයන් සම්බන්ධයෙන් පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| ජංගම නොවන ණයගැතියන් | 2010 ලෙජරය ප්‍රකාරව | 2010 මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු | රු. |
| මහ නගර සභා | 98,145,105 | 94,608,177 | 3,536,928 |
| නගර සභා | 110,214,867 | 106,464,136 | 3,750,731 |
| ප්‍රාදේශීය සභා | 379,441,859 | 371,404,415 | 8,037,444 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 2,270,125,714 | 2,001,971,658 | 268,154,057 |

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා 22 කින් හා නගර සභා දෙකකින් පිළිවෙලින් රු.4,419,202 ක් හා රු.189,725 ක් වූ ණය මුදල් වර්ෂ 30 කට වැඩි කාලයක සිට ලැබිය යුතු බවත් වැල්වෙටිතුරෙයි නගර සභාවෙන් රු.1,888,755 ක් වූ ණය මුදල් වර්ෂ 27 කට වැඩි කාලයක සිට ලැබිය යුතු බවත් නිරීක්ෂණය විය.

(ආ) නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.1,950,574,475 ක්වූ ගිණුම් ශේෂවලින් හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (LGIIP) ලැබිය යුතු රු.810,973,268 කින් පිළිවෙලින් රු.1,152,266,127 ක් එනම්, 59% ක් හා රු.91,440,122 ක් එනම්, 11% ක් පමණක් අදාල පාර්ශ්වයන් විසින් 2011 මැයි 20 දක්වා සනාථ කර තිබුණි.

### 1.2.4 කාර්යාල ගොඩනැගිලි කුලී සඳහා ප්‍රතිපාදනය

ආයතනය රජයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර, ගොඩනැගිල්ල සඳහා වූ වරිපනම් බදු වලින් 50% ක් වූ රු.101,110 ක් ආයතනය විසින් දරා තිබුනි. මෙයට අමතරව ඉදිරියට දැරීමට සිදුවිය හැකි කුලී සඳහා මසකට රු.50,000 බැගින් රු.600,000 ක් වූ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී වෙන් කර තිබුනි. සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපාදන වෙන් කිරීම රු.4,800,000 දක්වා වැඩි වී තිබුණද, මාසික කුලිය පිළිබඳ මේ දක්වා එකඟත්වයකට පැමිණ නොතිබුණි.

1.2.5 **නිෂ්කාර්ය අරමුදල්**

---------------------

විශේෂ ව්‍යාපෘති එනම්, පාරිසරික සංචාරක කර්මාන්තය, ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රදානයන් ලෙස රු. මිලියන 12 ක මුදලක් දේශීය ණය හා සංවර්ධන අරමුදලට මුදා හැර තිබුණද, දේශය ණය හා සංවර්ධන අරමුදල විසින් රු. මිලියන 4.134 ක් පමණක් ව්‍යාපෘතිවලට මුදා හැර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 7.866 ක මුදලක් අරමුදලෙහි නිෂ්කාර්යව පැවතුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනේ අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය බදු අයකිරීමෙන් පසු රු.11,085,041 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය බදු අය කිරීමෙන් පසු රු.13,585,427 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තයෙහි රු.2,500,386 ක අඩුවීමක් දැක්වුණි. ඉහත රු.11,085,041 ක් වූ අතිරික්තය තුළ 2010 වර්ෂය සඳහා පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ රු.22,012,308 ක් වූ ඌනතාවයද ඇතුළත් කර තිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2.2.1 **කාර්ය සාධනය**

-----------------

(අ) **ණය ප්‍රදානය**

--------------

මෙම අරමුදලේ ප්‍රධාන කාර්යයන් වනුයේ, නාගරික පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය සභාවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සහන පොළී අනුපාත යටතේ ණය මුදල් සැපයීමයි. සමාලෝචිත වර්ෂයේ විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ණය මුදල් සැපයීම සඳහා අරමුදල විසින් රු. මිලියන 162 ක මුදලක් වෙන් කර තිබුණු අතර, 2010 වර්ෂය තුළ රු. මිලියන 126.2 ක ණය ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු. මිලියන 30 ක් ඇස්තමේන්තු කර තිබුණු ව්‍යාපෘති 10 ක් සඳහා යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 38.1 ක් ලබා දී තිබුණි. ඒ අනුව, රු. මිලියන 8 ක් සමාලෝචිත වර්ෂය තුළ වැඩිපුර වියපැහැදම් කර තිබුණු අතර, ව්‍යාපෘති 7 ක් පමණක් නිම කර තිබුණි. ඉතිරි ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී කාර්යාල ගොඩනැගිල්ලක්, පුස්තකාලයක් හා අනුස්මරණ ශාලාවක් ව්‍යාපෘති 5 ක් යටතේ ඉදි කිරීමට ණය මුදල් සැපයීම සඳහා රු. මිලියන 20 ක් වෙන් කර තිබුණද, රු. මිලියන 12.5 ක් පමණක් වැය කර තිබුණු අතර, එක් ව්‍යාපෘතියක් පමණක් නිම කර තිබුණි.

(iii) සති පොළවල් හා ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීමට ව්‍යාපෘති 6 ක් සඳහා රු.මිලියන 20 ක් වෙන් කර තිබුණි. එක් ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 42.8 ක් විය පැහැදම් කර ව්‍යාපෘති 3 ක් පමණක් නිම කර තිබුණි. කෙසේ වුවද, කිරිබත්ගොඩ සති පොළ ඉදි කිරීම සඳහා කැළණිය ප්‍රාදේශීය සභාවට රු. මිලියන 35 ක මුදලක් විය පැහැදම් කර තිබුනි.

(iv) ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති, ජල ව්‍යාපෘති ඉදි කිරීම සහ වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු. මිලියන 35 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, 2010 දෙසැම්බර් 31 දක්වා කිසිදු ණය මුදලක් මුදාහැර නොතිබුණි.

**(ආ) හිඟ ණය වාරික අය කර ගැනීම**

----------------------------------

2010 ජනවාරි 01 දිනට පළාත් පාලන ආයතනවලින් ලැබිය යුතු රු . මිලියන 28.8 ක ණය වාරිකවලින් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු. මිලියන 14.3 ක මුදලක් පමණකි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 ජනවාරි 01 දිනට නගර සභාවලින් ලැබිය යුතු ණය වාරික අය කර ගැනීම සමාලෝචිත වර්ෂය තුළ ඉතා පහළ මට්ටමක විය. (එනම් 20%) මහ නගර සභා සහ ප්‍රාදේශීය සභාවලින් ණය අය කර ගැනීමේ අනුපාතය පිළිවෙලින් 98% ක් හා 53% ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමස්ථ ණය අයකර ගැනීමේ අනුපාතය 45.6% ක් විය.

(ii) පානදුර නගර සභාව සහ වැල්වෙටිතුරෙයි නගර සභාවට ලබදුන් රු.7,850,000 ක් හා රු.2,012,000 ක් වූ ණයවලින් පිළිවෙලින් රු.4,850,000 ක් හා රු.1,888,755 ක් 2010 දෙසැම්බර් 31 දිනට පරිශේෂව පැවතුණි.

(iii) හක්මණ ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු රු. මිලියන 3 ක්වූ ණය මුදලින් එක් වාරිකයක් හෝ අය කර ගෙන නොතිබුණි.

(iv) 2003 වර්ෂයේදී හිඟුරාන සතිපොළ සංවර්ධනය සඳහා දමන ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු රු.1,150,000 ක් වූ ණය මුදලින් රු.40,537 ක්වූ එක් වාරිකයක් පමණක් අයකර ගෙන තිබුණි. ඉන් පසු කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි.

(v) 1983 වර්ෂයේදී කරච්චි ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු රු.855,000 ක ණය මුදලින් 1999 වර්ෂය දක්වා රු.11,285 ක්වූ වාරිකයක් හා රු.486,677 ක් වූ පොලියක් අයකර ගෙන තිබුණි. ඉන් පසු කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි.

(vi) වලිකාමම් ප්‍රාදේශීය සභාවට 1982 වර්ෂයේදී ලබා දීතිබුණු රු.940,000 ක ණය මුදලින් රු.376,000 ක් වූ වාරික පමණක් අයකර ගෙන තිබුණි.

(vii) 1986 සහ 1987 වර්ෂවලදී මැදගම ප්‍රාදේශිය සභාවට ලබා දී තිබුණු රු.1,791,500 ක් වූ ණය මුදලින් රු.220,102 ක් වූ වාරික පමණක් අයකර ගෙන තිබුණි.

(viii) නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ බහ වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතනවලට ලබා දී තිබුණු පිළිවෙලින් රු.570,077,446 ක් හා රු.72,922,475 ක් වූ ණය මුදල්වලින් එක් වාරිකයක් හෝ අයකර ගෙන නොතිබුණි.

**(ඇ) හිඟ ණය පොලී අයකර ගැනීම**

2010 වර්ෂය තුළ අයකරගත් හිඟ ණය පොලිය රු. මිලියන 4.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය පොලිය රු. මිලියන 18.5 ක් විය. හිඟ පොලිය පිළිබඳ කාල විශ්ලේෂණ විස්තරයක් පහත දැක්වේ.

| කාල පර්ච්ඡේදය | හිඟ ණය පොලී මුදල |
|---|---|
| | රු. |
| වර්ෂ 5 ට වැඩි | 10,477,963 |
| වර්ෂ 1 ට වැඩි 5 ට අඩු | 3,206,253 |
| වර්ෂ 1 ට අඩු | 4,790,559 |
| එකතුව | 18,474,775 |

ඉහත දැක්වෙන අයකරගත යුතු ණය පොලී සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) පානදුර, අම්පාර සහ අම්බලන්ගොඩ නගර සභාවලට ලබා දී තිබුණු ණය මුදල් පිළිවෙලින් රු.7,850,000, රු.4,800,000 සහ රු.3,360,000 ක් වූ අතර, 2010 වර්ෂය දක්වා ඒවායින් ලැබිය යුතු පොලිය පිළිවෙලින් රු.6,356,000 ක්, රු.1,172,911 ක් හා රු.2,242,320 ක් විය.

(ii) ප්‍රාදේශීය සභාවලට ලබා දුන් ණය මත හිඟ ණය පොලී පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය සභාව | ලබාදුන් ණය මුදල | 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය | හිඟ හිටි කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | රු. | රු. | |
| හක්මන | 3,000,000 | 1,131,519 | 2005 - 2010 |
| බේරුවල | 9,900,000 | 193,696 | 2010 |
| බෙලිඅත්ත | 8,000,000 | 367,009 | 2010 |
| දමන | 1,150,000 | 285,015 | 2006 - 2010 |
| ඇඹිලිපිටිය | 5,122,900 | 485,762 | 2008 - 2010 |
| මැදගම | 1,791,500 | 2,399,427 | වර්ෂ 5 ට වැඩි |
| | | 4,862,428 | |

**(ඇ) පොලිය හැර ණය වාරික පමණක් අයකර ගැනීම**

පළාත් පාලන ආයතන 8 කට මුදාහැර තිබුණු රු.21,576,981 ක් වූ සම්පූර්ණ මුදලම අයකරගෙන තිබුණද, ඒ මත ලැබිය යුතු රු.81,325 ක් වූ පොලිය 2010 දෙසැම්බර් 31 දිනටත් අයකර ගෙන නොතිබුණි.

2.2.2 පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

---------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 ජනවාරි 19 දින එළඹි අංක 2201 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමට අනුව පළාත් පාලන ආයතන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ "බී" සංරචකය ක්‍රියාත්මක කිරීම දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පවරා තිබුණි. මේ යටතේ එ.ජ.ඩො. මිලියන 42.6 (රු.මිලියන 4,260) ක මුදලක් පළාත් පාලන ආයතන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 1,581 ක් ව්‍යාපෘතිය සඳහා මුදා හැරීමට ඇස්තමේන්තු කර තිබුණද, රු. මිලියන 972 ක මුදලක් පමණක් මුදාහැර තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා පරිගණක මෘදුකාංග වැඩසටහනක් හඳුන්වා දීමට රු.847,000 ක මුදලක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණද, විගණන දිනය වන 2011 මැයි 20 දින වනවිටත් වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

2.2.3 නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

---------------------------------------------------------

(අ) ගම්පොළ නගර සභාව - සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය

---------------------------------------------------------

ගිවිසුමට අනුව, ගම්පොළ නගර සභාවේ සාප්පු සංකීර්ණය ඉදි කිරීම 2003 සැප්තැම්බර් 5 දිනට හෝ ඊට ප්‍රථම නිම කළ යුතු විය. කෙසේ වුවද, එය නිම කර තිබුණේ 2006 ජූනි 18 දිනදීය. ප්‍රමාණ කළ අලාභ අය කර නොතිබුණි. ඉදි කර තිබුණු සාප්පු සංඛ්‍යාව ලියවිල්ලෙන් ලියවිල්ලට වෙනස් විය. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 70 ක් වුවද, තථ්‍ය වියපැහැදම රු. මිලියන 96.3 ක් විය. රු. මිලියන 26.3 ක් වූ වැඩිපුර වියපැහැදම පිළිබඳ අරමුදල් සැපයීමේ ක්‍රමය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉකුත් වූ වර්ෂ 5 කට වැඩි කාල පරිච්ඡේදය සඳහා එක වාරිකයක් හෝ ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ණය වාරික හා පොලිය රු.69,178,585 ක් විය.

(ආ) දඹුල්ල ප්‍රාදේශීය සභාව - සාප්පු සංකීර්ණය හා බස් නැවතුම්පොළ

---------------------------------------------------------------------------

දඹුල්ල ප්‍රාදේශීය සභාව සඳහා සාප්පු සංකීර්ණයක් හා බස් නැවතුම්පොළක් ඉදි කිරීමට රු.106,956,260 ක් දරා තිබුණි. මෙම වියදම වාරික 40 ක ණයක් ලෙස අයකර ගැනීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ඉල්ලා තිබුණි. කෙසේ වුවද, එම වියදමට අදාල ණය ගිවිසුම සහ බිල්පත්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුනි. කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය නිම කිරීමෙන් තොරව භාර දී තිබුණු බැවින් දඹුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීමෙන් වළකින ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට දන්වා තිබුණි. ව්‍යාපෘතියෙන් ජනනය වන මාසික ආදායම රු.326,650 ක් වුවද, ණය වාරික ඇතුළත් වියදම රු.1,108,752 ක් විය. විමර්ශන වාර්තාවට අනුව, මුළු හිඟ වාරික හා හිඟ පොලිය පිළිවෙලින් රු.18,191,169 ක් හා රු.45,281,083 ක් විය.

(ඇ) තිස්සමහාරාම ප්‍රදේශීය සභාව - සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය

---------------------------------------------------------------

තිස්සමහාරාම ප්‍රදේශීය සභාව සඳහා සාප්පු සංකීර්ණයක් ඉදි කිරීමට රු.38,251,754 ක් දරා තිබුණි. 2005 වර්ෂයේ සිට වාරික 40 කින් ණය මුදල අය කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදලට දන්වා තිබුණි. ණය ගිවිසුම හා ගෙවීම්වලට අදාල බිල්පත්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම සංකීර්ණය නිම කිරීමේ අඩුපාඩු හේතුවෙන් එය ආදායම් ජනනය කිරීමේ කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකිව තිබුනි. මුළු හිඟ ණය වාරික හා හිඟ පොලිය පිළිවෙලින් රු.9,374,703 ක් හා රු.18,908,929 ක් විය.

(ඈ) පොදු අදහස් දැක්වීම්

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ❖ අදාල ව්‍යාපෘති ලිපිගොනුවලට ගිවිසුම්වල පිටපත් අමුණා නොතිබුණි.
- ❖ ව්‍යාපෘති නිම කර තිබුණද, ඒවා භාවිතා කිරීමට හැකි තත්ත්වයක නොවීය.
- ❖ ගොඩනැගිලි ව්‍යාපෘතිවල අයිතිය ප්‍රාදේශීය සභාවලට මාරු කර ණය වාරික ගෙවීමට නියෝග කර තිබුණද, ගොඩනැගිලි උපයෝජනය කිරීමට හැකි තත්ත්වයක නොවීය.
- ❖ ව්‍යාපෘති ආදායමට වඩා ණය වාරික ඉතා ඉහළ බැවින් ඇතැම් සභා මූල්‍ය අර්බුදයන්ට මුහුණු දී තිබුණි.
- ❖ ණය ලබා දීමේදී ප්‍රමාණවත් ඇප ලබා ගෙන නොතිබුණි.

  උදා : ගම්පොළ සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය, දඹුල්ල සාප්පු සංකීර්ණය හා බස් නැවතුම්පොළ ව්‍යාපෘතිය සහ තිස්සමහාරාම සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය

## 2.2.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(i) හිඟ ණය සහ පොලිය අයකර ගැනීම

(ii) අයවැය පාලනය